GOVERNMENT INTERVENTIONS TO THE MARKET (Part-IV)

S. Madushanka

B.Sc (Mgt) Accounting (Special) (U.G)

University of of Sri Jayewardenepura

සැපයුම්කරු මත ඒකක සහනාධාරයක් ලබා දීම

නිෂ්පාදනය කරනු ලබන භාණ්ඩ ඒකකයක් සඳහා නිශ්චිත රුපියල් ප්‍රමාණයක් සහනාධාර වශයෙන් ලබා දීම සැපයුම්කරු මත ඒකක සහනාධාරයක් ලබා දීම යන්නෙන් අදහස් වේ.

නිදසුන් -

තේ කිලෝවකට රු. 20/- ක සහනාධාරයක් ලබා දීම

සැපයුම්කරු මත ඒකක සහනාධාර ලබා දීමේ දී අනිවාර්ය ප්‍රතිඵලය වන්නේ නිෂ්පාදන පිරිවැය පහළ යාම යි.

මෙ නිසා සැපයුමෙහි වැඩි වීමක් සිදුවන අතර සහනාධාරයේ ප්‍රමාණයෙන් සැපයුම් වක්‍රය දකුණට විතැන් වේ.

ClassWork.LK

ඒකක සහනාධාරයක් නිසා වෙළෙඳපොළ සමතුලිතයට සිදුවන බලපෑම ලේඛනයක් මගින්

පහත දක්වෙන්නේ තරගකාරී භාණ්ඩ වෙළෙඳපොළක කිසියම් භාණ්ඩයක් සඳහා වන **ඉල්ලුම් සැපයුම් ලේඛන ය.**

මිල (රු)	ඉල්ලුම් ප්‍රමාණය (ඒකක)	සැපයුම් ප්‍රමාණය (ඒකක)
0	80	0
5	70	10
10	60	20
15	50	30
20	40	40
25	30	50
30	20	60
35	10	70
40	0	80

ClassWork.LK

ආණ්ඩුව මෙම භාණ්ඩයේ සෑම නිෂ්පාදන ඒකකයක් සඳහා රුපියල් 5.00ක සහනාධාරයක් ලබා දෙන්නේ යයි සිතන්න. මේ නිසා වෙළෙඳපොළ **නව සැපයුම් ලේඛනය** පහත පරිදි වේ.

$Qd = 80 - 2P$

$Qs = 0 + 2P$

මිල (රු)	ඒකක සහනාධාරය (රුපියල්)	සහනාධාරයේ පසුමිල (රු)	සැපයුම් ප්‍රමාණය (ඒකක)
0	5	-5	0
5	5	0	10
10	5	5	20
15	5	10	30
20	5	15	40
25	5	20	50
30	5	25	60
35	5	30	70
40	5	35	80

ඒකක සහනාධාරය නිසා නිෂ්පාදකයා ගේ පිරිවැය අඩු වන බැවින් සහනාධාර ලබා දීම නිසා සැපයුම් ප්‍රමාණය වැඩි වී ඇති බව ඉහත වගු සටහනෙන් පැහැදිලි ය.

ClassWork.LK

ඒකක සහනාධාරයක් නිසා වෙළෙඳපොළ සමතුලිතයට සිදුවන බලපෑම ප්‍රස්තාරයක් මගින්

ඒකක සහනාධාරයක් ලබා දීම ආශ්‍රිත ව ඉහත ලේඛනවලින් හෙළි වන තොරතුරු පහත ආකාරයට **ප්‍රස්තාර සටහන් මගින්** ද පෙන්නුම් කළ හැකි ය.



ClassWork.LK

නිෂ්පාදකයන්ට ඒකක සහනාධාර ලබා දීම නිසා සැපයුම් වක්‍රය සහනාධාරයේ ප්‍රමාණයෙන් S - S1 දක්වා දකුණට විතැන් වී ඇති අතර පෙර තිබූ සමතුලිතය ද වෙනස් වී ඇත.

සහනාධාරයට පෙර,

සමතුලිත මිල = රුපියල් 20.00

සමතුලිත ප්‍රමාණය = ඒකක 40

සහනාධාරයට පසු,

සමතුලිත මිල = රුපියල් 17.50

සමතුලිත ප්‍රමාණය = ඒකක 45

ClassWork.LK

ඒකක සහනාධාර වල ශුභසාධන ප්‍රතිවිපාක හඳුනා ගැනීම

නිෂ්පාදකයන්ට ඒකක සහනාධාර ලබා දීම නිසා ඉහත රූප සටහනේ දැක්වෙන පරිදි සමතුලිතය වෙනස් වීමට අමතර ව තවත් ශුභසාධන ප්‍රතිවිපාක හටගනී.



ClassWork.LK

සහනාධාරයට පෙර,

පාරිභෝගික අතිරික්තය = $A + B$

$$= \frac{\text{(උපරිම ඉල්ලුම් මිල - සමතුලිත මිල) x සමතුලිත ප්‍රමාණය)}}{2}$$

$$= \frac{(40 - 20) \text{ x } 40}{2}$$

= රු. 400

පාරිභෝගික අතිරික්තය = $I + J$

$$= \frac{\text{(සමතුලිත මිල - අවම සැපයුම් මිල) x සමතුලිත ප්‍රමාණය)}}{2}$$

$$= \frac{(20 - 0) \text{ x } 40}{2}$$

= රු. 400

ආර්ථික අතිරික්තය = $(A + B) + (I + J)$

= 400 + 400

= රු. 800//

ClassWork.LK

<u>සහනාධාරයට පසු,</u>

පාරිභෝගික අතිරික්තය = $A + B + I + H + G$

= (උපරිම ඉල්ලුම් මිල - සමතුලිත මිල) නව සමතුලිත ප්‍රමාණය) / 2

$= \frac{(40 - 17.50) \times 45}{2}$

= රු. 506.25//

නිෂ්පාදන අතිරික්තය = $B + C + I + J$

= (නිෂ්පාදනයට ලැබෙන මිල - අවම සැපයුම් මිල) x සමතුලිත ප්‍රමාණය) / 2

$= \frac{(22.5 - 0) \times 45}{2}$

= රු. 506.25//

ආර්ථික අතිරික්තය = $(A + B + I + H + G) + (B + C + I + J)$

= 506.25 + 506.25

= රු. 1012.50//

ClassWork.LK

<u>සහනාධාරය නිසා පාරිභෝගික අතිරික්තයේ වූ වැඩි වීම</u>

$= (A + B + I + H + G) - (A + B)$

$= I + H + G$

$= 506.25 - 400$

= රු. 106.25//

<u>සහනාධාරය නිසා නිෂ්පාදන අතිරික්තයේ වූ වැඩි වීම</u>

$= (B + C + I + J) - I + J$

$= B + C$

$= 506.25 - 400$

= රු. 106.25//

ClassWork.LK

<u>සහනාධාරය නිසා ආර්ථික අතිරික්තයේ වූ වැඩි වීම</u>

I ක්‍රමය

$$= (I + H + G) + (B + C)$$

$$= 106.25 + 106.25$$

= රු. 212.50//

II ක්‍රමය

= [සහනාධාරයට පසු ආර්ථික අතිරික්තය] - [සහනාධාරයට පෙර ආර්ථික අතිරික්තය]

$$= 1012.50 - 800$$

= රු. 212.50//

ClassWork.LK

සහනාධාරය වෙනුවෙන් රජයට දැරීමට සිදුවන පිරිවැය

$$= B + C + I + B + G + F$$

= රු. 5 x 45

= රු. 225//

සහනාධාරය නිසා සමාජ ශුභ සාධනයට වන බලපෑම

{ පාරිභෝගික ආර්ථිකයේ වැඩිවීම } + { නිෂ්පාදන අතිරික්තයේ වැඩිවීම } - { රජයේ පිරිවැය }

I ක්‍රමය

$$= (I + H + 0) + B + C - (B + C + 1 + H + G + F)$$

$$= 106.25 + 106.25 - 225$$

$$= 212.50 - 225$$

= රු. 12.50//

ClassWork.LK

II ක්‍රමය

$$= \frac{(\text{සමතුලිත ප්‍රමාණයේ වෙනස - සහනාධාරයේ ප්‍රමාණය})}{2}$$

$$= \frac{5 \times 5}{2}$$

= රු. 12.50//

ClassWork.LK

ඒකක සහනාධාරයක් නිසා වෙළෙඳපොළ සමතුලිතයට සිදුවන බලපෑම සමීකරණ මගින්

ඉහත සැලැකිල්ලට ගත් නිදසුනට අනුව, සහනාධාරයට පෙර ඉල්ලුම් හා සැපයුම් සමීකරණ,

$$Qd = 80 - 2p$$
$$Qs = 0 + 2p$$

සහනාධාරයට පෙර සමතුලිතය,

$$80 - 2P = 0 + 2P$$
$$80 = 4P$$
$$20 = P$$

සමතුලිත මිල = රු. 20.00//

සමතුලිත ප්‍රමාණය,

$$= 80 - 2 \times 20$$
$$= 40$$

= ඒකක 40 //

ClassWork.LK

ඒකක සහනාධාරය ලබා දීම නිසා නිෂ්පාදන පිරිවැයෙහි අඩුවක් සිදුවන බැවින්, සහනාධාරයෙන් පසු සැපයුම් සමීකරණය පහත පරිදි සොයාගත යුතුය.

$Qs = 0 + 2\ (P + S)$ ← ඒකක සහනාධාරය

$Qs = 2\ (P + 5)$

සහනාධාරයෙන් පසු සැපයුම් සමීකරණය

$Qs = 2P + 10$

$Qs = 10 + 2P$

සහනාධාරයට පසු සමතුලිතය,

$$Qd = Qs$$
$$80 - 2P = 10 + 2P$$
$$70 = 4P$$
$$17.50 = P$$

සමතුලිත මිල = රු. 17.50//

සමතුලිත ප්‍රමාණය, (Qs)

$$Qs = 10 + 2 \times 17.50$$

= ඒකක 45 //

ClassWork.LK

2021
2022
2023

උසස් පෙළ

ගිණුම්කරණය
ආර්ථික විද්‍යාව
ව්‍යාපාර අධ්‍යයනය

2021
2022

සාමාන්‍ය පෙළ

ව්‍යාපාර හා ගිණුම්කරණ අධ්‍යයනය

තනි හෝ කණ්ඩායම් පන්ති

(English & Sinhala Medium)

0763655550

S. Madushanka
B.Sc (Mgt) Accounting (Special) (U.G)
University of of Sri Jayewardenepura